**බලංගොඩ නගර සභාව**
**රත්නපුර දිස්ත්‍රික්කය**

1. මූල්‍ය ප්‍රකාශන
--------------------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශය 2014 අප්‍රේල් 01 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 ජූලි 03 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයා ගේ වාර්තාව 2014 අගෝස්තු 18 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය
------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට බලංගොඩ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම
--------------------------------------------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 1.24 පරිදි අයවැයගත සංඛ්‍යා හා සත්‍ය සංඛ්‍යා වෙන වෙනම නිරූපණය වන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණු අතර, අයවැගත සංඛ්‍යා ඉක්මවා නැති බවට හෝ ඉක්මවා තිබෙන විට ඒවා මූල්‍ය ප්‍රකාශනවල පාද සටහනක් ලෙස හෝ අනාවරණය කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ ලද මුද්දර ගාස්තු රු. 6,459,755ක් සමුච්චිත අරමුදලට බැර නොකර වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) බැංකු ගිණුම් දෙකක බැංකු සැසඳුම් ප්‍රකාශයේ දිගින් දිගටම පැවත එන එකතුව රු. 4,098,785ක් වූ විවිධ ශේෂ 12ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.3 නොසැසඳුණු ගිණුම්
----------------------

ගෙවිය යුතු එකතු කළ අගය මත බදු ගිණුමේ 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය ලෙජර් ගිණුම අනුවරු. 8,143,378ක් වුවත්, බදු ලේඛණය අනුව රු. 8,302,782ක් වීමෙන් රු. 159,404ක් වැඩියෙන් දැක්වේ.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම
----------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරිම නිසා රු.5,271,071 ක්වූ ගනුදෙනු විගණනයේදි සතුටුදායක ලෙස සන්නිරික්ෂණය කිරිමට නොහැකි විය.

1.3.5 නීතිරීති රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

---

පහත කරුණු නිරික්ෂණය කෙරේ.

| (අ) නීතිරීති හා රෙගුලාසියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i) මුදල් රෙගුලාසි 396 (ඇ) | නිකුත් කළ නමුත් 2013 දෙසැම්බර් 31 දිනට ගෙවීමට ඉදිරිපත් නොවූ මාස 06 ඉක්ම වූ එකතුව රු. 7,105,118ක් වූ චෙක්පත් 232 ක් නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 486 | 2013 දෙසැම්බර් 31 දිනට තැන්පත් කළ නමුත් අගරු වූ එකතුව රු. 2,153,058ක් වූ චෙක්පත් 50ක් නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 751 | එකතුව රු. 523,950ක් වූ කුට්ටි ගල් (Inter Locking Blocks) 17040ක් තොග පොතට ගෙන නොතිබුණි. |
| (ආ) 2006 ජනවාරි 25 දිනැති ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | |
| 1.3.2 මාර්ගෝපදේශය | මිල කැඳවීම් රහිතව අවස්ථා 10ක දී එකතුව රු.485,286ක භාණ්ඩ හා සේවා සභාවට අයත් තානායම සඳහා මිල දී ගෙන තිබුණි. |
| (ඇ) 2002 නොවැම්බර් 28 දිනැති IAI/2002/02 අංක දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය තුළ මිල දී ගත් රු.146,700ක පරිගණක ඇතුළු උපාංග හා ඊට පෙර වර්ෂවල මිල දී ගත් පරිගණක 31ක් සභාව සතුව පැවැතියද, චක්‍රලේඛය පරිදි පරිගණක වත්කම් ලේඛණයක් නඩත්තු කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

---

2.1 මූල්‍ය ප්‍රතිඵල

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු. 7,207,355ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු. 2,295,804ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 4,911,551ක පිරිහීමක් ඇති වී තිබුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

-------------------------------------

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ සමස්ත පුනරාවර්තන ආදායම රු. 6,169,328කින්වැඩි වී තිබුණ ද, ප්‍රවාහන සම්බන්ධතා හා වෙනත් සේවා සහ ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියාව හා නඩත්තුව වෙනුවෙන් කළ වියදම ඉකුත් වර්ෂයට වඩා රු. 9,569,716කින් වැඩි වී තිබීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.3 ආදායම් පරිපාලනය

-----------------------

ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

--------------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ විග්‍රහයක් පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | තථ්‍ය ලැබීම් | 2013 දෙසැම්බර් 31 දිනට හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 6,503 | 6,900 | 1,285 |
| වාහන කුලියට දීම | 1,000 | 758 | 409 |
| කඩ කුලී (බස් නැවතුම) | 8,120 | 8,304 | 652 |
| කඩ කුලී | 7,073 | 6,821 | 956 |

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) අවුරුදු 01 කට වැඩි හිඟහිටි වරිපනම් හා කඩ කුලී පිළිවෙලින් රු. 61,006ක් හා රු. 352,179 විය.

(ආ) ඇස්තමේන්තු කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය තුළ අයකරගැනීමට නොහැකි වූ එකතුව රු. 2,387,186ක් වූ ආදායම් විෂයයන් 02ක් විය.

(ඇ) බදු කරුවන් 07 දෙනෙකුගෙන් අය විය යුතු එකතුව රු. 7,058 ක් වූ බදුවල හිඟ හිටි කාල සීමාව මාස 22 සිට 48 දක්වා විය.

(ඈ) නව බස් නැවතුම් පොළ කඩ කාමර 15ක එකතුව රු. 942,923ක්වූ හිඟ කුලී සහ එකතුව රු. 117,000ක් වූ පොදු වෙළඳසැලේ කඩකාමර දෙකකින් හිඟ කුලී හා ප්‍රමාද දඩ අයකිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි

3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පසුගිය කාර්තු 07ක් වෙනුවෙන් දේශිය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළ යුතු එකතු කල අගය මත බදු මුදල රු. 8,302,782 ක් විය.

(ආ) 2009 ජූලි මස සිට 2012 පෙබරවාරි මස දක්වා කාලය තුළ අවස්ථා 06ක දී ලබා දුන් රු. 768,460ක අත්තිකාරම් මුදල් 2013 දෙසැම්බර් 31 දින දක්වාමත් පියවා නොතිබුණි.

(ඇ) දේශීය ණය සහ සංවර්ධන අරමුදල් මගින් බස් නැවතුම්පල සහිත වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා 2005 දෙසැම්බර් 31 දින ලබා දී තිබුණු රු. 111,209,828ක් වූ ණය මුදලින් 2008 පෙබරවාරි 15 දින රු. මිලියන 20ක් එකවර පියවා තිබුණ ද, 2013 දෙසැම්බර් 31 දින වන විට කාර්තු වශයෙන් ගෙවිය යුතු හිඟ ණය වාරික 91,209,828ක් සහ පොලිය රු. 43,427,893ක් විය.

(ඈ) 2013 සැප්තැම්බර් මස 03 වන දින සිට 2013 නොවැම්බර් 30 දින දක්වා වූ මාස 03 ක කාලය නියැදියක් ලෙස ගෙන තානායමට පැමිණි අමුත්තන් පිළිබඳව සිදු කළ ලේඛණ පරික්ෂාවේදී අමුත්තන්ගේ ලේඛණයේ සටහන් නොකර නවාතැන් ගත් අවස්ථා 54 ක් නිරීක්ෂණය විය.

(ඉ) සභාවට අයත් බැංකු ගිණුම් වෙනුවෙන් වූ බැංකු සැසඳුමකට අනුව රු. 1,000,000ක් වර්ෂ 05 කට වැඩි කාලයක සිට දිගින් දිගටම කිසිදු හේතුවක් නොදක්වා මුදල් ශේෂයට ගැලපීම් කර තිබුණි.

(ඊ) වැසි ජල අපවහන කාණු පද්ධතියක් ඉදිකිරීම සඳහා දේශීය ණය සහ සංවර්ධන අරමුදල මගින් 2005 වර්ෂයට පෙර සභාවට ලබා දී තිබුණු රු. 8,815,586ක ණය මුදලක් ආපසු එම අරමුදල වෙත ගෙවිය යුතු බවට ජාතික බේරුම්කරණ මධ්‍යස්ථානය විසින් තීන්දුවක් දී තිබුණ ද, 2012 දෙසැම්බර් 31 දිනට රු. 5,358,264ක් වූ හිඟ පොළිය ද සහිතව එකතුව රු. 14,173,850ක් ගෙවීමට නගර සභාව විසින් පියවර ගෙන නොතිබුණි. එමෙන්ම, මූල්‍ය ප්‍රකාශනවල මේ පිළිබඳ කිසිදු හෙළිදරව් කිරීමක් සිදුකර නොතිබුණි.

3.2 ඌන උපයෝජිත වත්කම්

-----------------------------

තානායම සඳහා තබාගෙන ඇති ආරක්ෂිත සේප්පුව 2013 දෙසැම්බර් 04 විගණිත දිනය වන විට ද එහි මුදල් තැන්පත් කිරීම සඳහා භාවිතයට ගෙන නොතිබුණු අතර, එම මුදල්, තානායම් කළමණාකරුගේ පුද්ගලික භාරයේ පැවතිණි.

3.3 ආර්ථික නොවූ ගනුදෙනු

------------------------------

එකතු කළ අගය මත ගෙවිය යුතු රු. 172,806ක බද්දක් රු. 157,979ක් ලෙස තක්සේරු කිරීම නිසා හිඟ රු. 14,827ක බදු මුදලක් වෙනුවෙන් රු. 14,848ක් දඩ ලෙස ගෙවීමට නියමිතව තිබුණි.

3.4 කොන්ත්‍රාත් පරිපාලනය

----------------------------

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) එක් ගමකට එක වැඩක් වැඩසටහන යටතේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ලද ප්‍රතිපාදන මගින් රු. 970,689ක් වැය කර බලංගොඩ ප්‍රජා ශාලාව ඉදි කර තිබුණි. මෙම ඉදිකිරීම සඳහා වට ප්‍රමාණය මි.මි. 2000 බැගින් වූ ගස් 05ක් සහ මි.මි. 1500 හා මි.මි. 1000ක ගස් 02ක් රු. 25,447ක් වැය කර ඉවත් කළ ද, එම දැව 2013 දෙසැම්බර් 12 දින විගණනය සඳහා ඉදිරිපත් කිරීමට අපොහොසත් විය.

(ආ) සුනන්දාරාම අතුරු මාර්ගය අන්තර් සම්බන්ධතා කුට්ටි ඇතිරීමේ දී මාර්ගයේ අඟල් 02 උසට ගල්කුඩු අතුරා ඒ මත ගල් ඇතිරීම සඳහා වර්ග මීටර් 85.75ක් සඳහා රු. 169,005 ගෙවා

තිබුණද, 2013දෙසැම්බර් 12 දින වන විටවර්ග මීටර් 76.33ක් පමණක් ඉටුකර තිබුණි.මේ නිසා වර්ග මීටර් 9.42ක් සඳහා රු. 18,566ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) බලංගොඩ මහජන පොල සඳහා අතිරේක මඩු 40 ක් ඉදි කිරීමේ දී වහලය සඳහා යෙදිය යුතු කාප්පයක දිග අඩි 11ක් විය යුතු වුවද, එය දිග අඩි 10.5ක් ලෙස නිම කර තිබීම නිසා රු. 16,773ක් වැඩිපුර ගෙවා තිබුණු අතර, සවිකිරීමේදී එම කාප්ප 12ක ආනතිය ද වෙනස් වී තිබුණි. කාප්ප කණුවලට සම්බන්ධ කිරීමේදී ඇණ යෙදීම වෙනුවට ඒවා කණුවලට තබා වැල්ඩින් කර තිබූ බව 2013 දෙසැම්බර් 11 දින කරන ලද ක්ෂේත්‍ර පරික්ෂාවේදි අනාවරණය විය. එමෙන්ම, වහලයේ දික් අඩි 120ක් සඳහා තහඩු යොදා නොතිබුණු නමුත් ඒ සඳහා රු. 21,000ක් ගෙවා තිබුණි.

3.5 දෘෂ්‍ය අක්‍රමිකතා

-------------------

නවාතැන් පහසුකම් සහ ආහාර පාන ලබාගත් බවට බලංගොඩ තානායම් කළමනාකරු රු. 157,982ක ලදුපත් නිකුත් කර තිබුණු නමුත්, තානායමේ දෛනික ආදායම් ලේඛණය සහ ලදුපත්වල කාර්යාලීය පිටපත් අනුව රු. 9,225ක් පමණක් ආදායම ලෙස ලැබී තිබුණි. මේ නිසා රු. 148,757 ක මුදලක් තානායමට අහිමි වී තිබුණි.

3.6 කාර්ය මණ්ඩල පරිපාලනය

------------------------------

(අ) සභාවේ 2013 දෙසැම්බර් 06 දිනට අනුමත කාර්යාල කාර්යය සහායක සංඛ්‍යාව 07 ක් වූ නමුත් එදිනට පුරප්පාඩු 06ක් විය. එම පුරප්පාඩු සඳහා අනියම් පදනම මත 06 දෙනෙකු බඳවා ගෙන තිබුණ ද, ඔවුන්ගෙන් තිදෙනෙකුට රාජකාරි පැවරීමකින් තොරව 2013 නොවැම්බර් මාසයේ සිට වැටුප් ගෙවා තිබුණි.

(ආ) අනුමත කාර්ය මණ්ඩලයට අයත් නොවන අනියම් කම්කරු තනතුරු දරන 41 දෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂය තුළ වැටුප් සහ දීමනා ලෙස රු. 6,067,364 ක් ගෙවා තිබුණි.

4. පද්ධති හා පාලන

-----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය